# ශ්‍රී ලාංකේය භික්ෂු සංස්ථාව හා විහාරය සතු දේපළ අයිතිවාසිකම පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

කලුන්දෑවේ චන්දවිමල හිමි[1]
ගල්වැවේ විමලඛන්ති හිමි[2]

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ මධ්‍යකාලීන අවධිය වන විට භික්ෂුවට හා විහාරයට විශාල වශයෙන් දේපළ හිමිව තිබුණි. එම දේපළ ආරක්ෂා කර ගැනීම සඳහා නිකුත් කරන ලද අණ පනත් සමූහයක් ද රාජ්‍ය තන්ත්‍රය විසින් පනවා තිබේ. දේපළ ලැබීම හා ඒවාට හිමිකම් පෑම විවිධ ස්වරූපයක් ගත් අතර ඇතැම් විටෙක ඒ සඳහා සකස් කළ නීති රීති ද විවිධත්වයක් ගත් බව පෙනේ. මෙරට සසුනේ මුල් සියවස් දෙකේදී දේපළ පරිහරණය සාංඝික ක්‍රමය යටතේ ක්‍රියාත්මක වූයේ නමුත් එම තත්ත්වය ක්‍රි. පූ. පළමුවන සියවසින් පසුව වෙනස් වන ආකාරයක් දැකගත හැකිය. ඒ අනුව එක් එක් පුද්ගලයන් හා පුද්ගල කණ්ඩායම් වෙනුවෙන් ද, විවිධ ආයතනවල එක් එක් ස්ථාන පදනම් කරගෙන ද දේපළ පැවරීම්, පරිත්‍යාග කිරීම් සිදු කර තිබේ. මෙම පරිත්‍යාග කිරීම් සම්බන්ධයෙන් මෙන් ම දේපළ පරිහරණය කළ යුතු ආකාරය හා ඒවා උල්ලංඝනය කිරීම වෙනුවෙන් පනවන ලද නීති රීති ද ඇතුළත් ඓතිහාසික මූලාශ්‍ර රැසක් ශේෂව ඇති අතර අවසන් වරට 1931 අංක 31 දරන බෞද්ධ විහාර දේවාලගම් පනතින් ද මේ පිළිබඳව අවධානය යොමු කර තිබේ. භික්ෂුව හා ආරාමය ආශ්‍රිත දේපළ පරිහරණය අතීතයේදී මෙන් ම වර්තමානය තුළ ද ගැටලු රැසක් නිර්මාණය වී තිබේ. මෙම පර්යේෂණයේදී භික්ෂුවට හා ආරාමයට දේපළ ලැබුණේ කවර ස්වරූපයෙන් ද, ඒවා පරිහරණය කළේ කෙසේ ද, පරිහරණය කිරීමේදී ඉස්මතු වූ ගැටලු කවරේ ද, ඒ සඳහා පැන වූ නීති රීති මොනවා ද, විහාර දේවාලගම් පනතින් මේ සඳහා දක්වන නිර්ණායකයන් කවරේ ද යන්න සාකච්ඡාවට බඳුන් වෙයි.

## අරමුණු හා ක්‍රමවේදය

නූතන සංඝ සමාජය තුළ පෞද්ගලික හා විහාරය සතු සාංඝික දේපළ සම්බන්ධයෙන් ප්‍රශ්න රැසක් නිර්මාණය වී තිබේ. එවැනි තත්ත්වයන් නිරාකරණය කර ගැනීම සඳහා ඓතිහාසික මූලාශ්‍රවලින් හා නූතනයේ මේ සම්බන්ධයෙන් පනවා ඇති නීති රීති කෙසේ භාවිත කළ හැකිද යන්න පෙන්වාදීම මෙහි අරමුණ

1 ආධුනික කථිකාචාර්ය, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, chandawimalakalundewe@yahoo.com

2 ආධුනික කථිකාචාර්ය සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, bomaluwatemple@gmail.com

වෙයි. මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහා මිහින්තලේ පුවරු ලිපි දෙක, අභයගිරි සංස්කෘත ලිපිය, තෝණිගල ලිපිය, අනුරාධපුරයේ පස්වන කාශ්‍යප රජුගේ වෙස්සගිරියේ පුවරු ලිපිය, පුලියන්කුලමේ පුවරු ලිපිය, එප්පාවල ලිපිය, පොළොන්නරුවේ ගල්විහාර ලිපිය වැනි අභිලේඛන මූලාශ්‍රද පොළොන්නරු අවධියේ සිට මහනුවර අවධියේ අවසානය දක්වා ලිය වී ඇති කතිකාවත් ද, 1931 නිකුත් කළ විහාර දේවාලගම් පනත ද බෙහෙවින් වැදගත් වන මූලාශ්‍රයන්ය. මෙම අධ්‍යයනයේදී ඉහත සඳහන් කළ ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් කරුණු ඓතිහාසික වශයෙන් විමර්ශනයට ලක් කෙරේ.

**සාකච්ඡාව**

ක්‍රි. පූ. තෙවන, දෙවන, පළමුවන සියවස්වල මෙරට භික්‍ෂු සමාජය වෙත පරිත්‍යාග කරන ලද බොහෝ දේපළ සංඝික වශයෙන් පිරිනැමූ පරිත්‍යාගයන්ය. ඒ බවට නිදසුන් රැසක් මිහින්තලේ හා වෙස්සගිරිය වැනි මුල් කාලීන පුදබිම් ආශ්‍රිතව ඇති ශිලාලේඛන සාක්‍ෂි සපයයි. දායක පිරිස් භික්‍ෂූන් වහන්සේලා වෙත ඒවා පරිත්‍යාග කළේ ''අගත අනගත චතුදිස සගස'' යනාදි වශයෙන් පොදු පරිහරණය සඳහා හෙවත් සංඝික පූජා භුක්තිය සඳහා බව මිහින්තලෙන් හමුවන හැත්තෑවකට අධික බ්‍රාහ්මී අභිලේඛනවලින් පැහැදිලි වෙයි. (Inscriptions of Ceylon, Vol. 1, 1970, pp. 1 - 6) මෙවැනි පරිත්‍යාගයන් සඳහා වෙස්සගිරියෙන් හමුවන සෙල් ලිපි ද වැදගත් තොරතුරු රැසක් අනාවරණය කරයි. (Inscriptions of Ceylon, Vol. 1, 1970, pp. 6 - 7) මෙවැනි ස්ථාන රැසක් තත් අවධියේ ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලින් හමුවන අතර ඒ හැම එකකදීම පාහේ පොදු පිළිවෙත වී තිබෙනුයේ සංඝික පරිහරණ භුක්තියයි.

මෙම තත්ත්වය ඊට සියවස් දෙක තුනකට පමණ පසුව විවිධත්වයක් ගත් බව පෙනේ. ඒ අනුව දායක පිරිස් පුද්ගලිකව භික්‍ෂූන් වහන්සේලාට මෙන්ම විහාරස්ථානයන්හි එක් එක් ස්ථාන මූලික කරගෙන ද දීමනා පිරිනමා තිබේ. (Inscriptions of Ceylon, Vol. II, (Part I) 1983, p. 23., Epigarphia Zeylanica, Vol. III, 1933, p. 154) විහාරස්ථාන ධනයෙන් මෙන්ම භවභෝග සම්පත්වලින් ආඪ්‍යවන විට ඒවා භුක්ති විඳීම සම්බන්ධයෙන් ගැටලු රැසක් ඇති වෙයි. විහාරස්ථාන සතුව පැවති ඉඩම්වල හා භික්‍ෂූන් වහන්සේලාගේ තත්ත්වය කවරේ ද යන්න ''විහාරස්ථානවල සිටි භික්‍ෂූන් වහන්සේලා ඉඩම් හිමි රදල පංතියක් සේ මෙකල දිස්වීය.'' යනුවෙන් රණවීර ගුණවර්ධන මහතා දක්වන අදහසින් පැහැදිලි වෙයි. (ගුණවර්ධන, 1993,පිටු. 118 - 138) විහාර සන්තක දේපළ පරිහරණය කිරීම සම්බන්ධයෙන් පැන වූ නීති රීති සමුදායක් ඓතිහාසික මූලාශ්‍රවල සඳහන්ව තිබේ. ඒ අනුව විහාරය සතු 'සංඝික දේපළ' කිසිම විටෙකත් පුද්ගල සන්තක නොකළ යුතු බවත්, (Epigraphia Zeylanica, Vol. 1, 1904 - 1912, p. 44) විහාරය සතු දේපළ භික්‍ෂුවක් විසින් වංචනික ලෙස නොගත යුතු බවත්, (Epigraphia Zeylanica, Vol. 1, 1904 - 1912, p. 45) විහාරයට අනුබද්ධ ගම් බිම් උකසට හෝ

තෑගි හෝ බදු හෝ වශයෙන් නොපැවරිය යුතු බවත් (Epigraphia Zeylanica, Vol. 1, 1904 - 1912, p. 90) විහාරයට අයත් ගස් වැල් රජයේ නිලධාරීන් විසින් නොකැපිය යුතු බවත් දන්වා ඇත. (Epigraphia Zeylanica, Vol. 1, 1904 - 1912, p. 44) මෙයට අමතරව බුදුසසුනට ලබාදුන් පමුණුගම්; කිසිවෙකු විසින් හෝ ක්‍රෝධ සහගතව නැවත නොගත යුතු බවද අවධාරණය කර තිබේ. (Epigraphia Zeylanica, Vol. 1, 1904 - 1912, p. 44) ජේතවන පුවරු ලිපියට අනුව විහාර ගම් බිම් අන් අයට පැවරූ අයට දඬුවම් වශයෙන් දිවයිනෙන් පිටුවහල් කළ යුතු යැයි නියම කර තිබේ. (Epigraphia Zeylanica, Vol. 1, 1904 - 1912, p. 233) මේ ආකාරයෙන් පනවා ඇති නීතිවලින් පෙනී යනුයේ විහාරස්ථාන සතු දේපළ අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම, විකිණීම, වංචනික ලෙස අත්පත් කර ගැනීම ආදී කටයුතු තත් අවධීන්හි සිදුව ඇති බවය. මෙයින් පැහැදිලි වනුයේ විහාරයේ වාසය කරන භික්ෂූන් වහන්සේලාට සංඝික දේපළ සම්බන්ධයෙන් තනි අයිතියක් කියා පෑ නොහැකි බවය. එසේ කරන්නේ නම් එය දඬුවම් ලැබිය හැකි කරුණක් ලෙසින් පෙන්වා දී තිබේ.

විහාරස්ථාන සතු දේපළ සම්බන්ධයෙන් මේ ආකාර වූ විස්තර සමුදායක් පසු කාලීන මූලාශ්‍රයන්හී ද දක්නට ලැබෙන අතර 1931දී නිකුත් කළ විහාර දේවාලගම් පනතේ එන කරුණු සම්බන්ධයෙන් ද අවධානය යොමු කළ යුතුව පවතී. එහි තෙවන වගන්තියේ දැක්වෙන ආකාරයට දිවයින තුළ ඇති සෑම විහාරස්ථානයකට ම මෙම ආඥා පනතේ විධි විධාන වලංගු වේ. (ආනන්ද එන්. තිලකරත්න, 2011, පි. 46) එහෙත් දළදා මාලිගාව, අටමස්ථානය හා ශ්‍රී පාදස්ථානය හැර වෙනත් ඕනෑම විහාරස්ථානයක් බෞද්ධ විහාර දේවලගම් පනතේ ඇතැම් විධිවිධානවලින් නිදහස් කිරීමේ බලය ජනාධිපතිතුමාට ඇති බව ඒ සමගම සඳහන් කර ඇත. (ආනන්ද එන්. තිලකරත්න, 2011, පි. 46) ජනාධිපතිවරයාට ආණ්ඩුවේ ගැසට් පත්‍රයක් මගින් ඉහත සඳහන් කළ ස්ථාන හැර ඕනෑම විහාරයක් ආඥාපනතට යටත් ව නිදහස් කළ හැකි බව පැහැදිලි වෙයි. ආඥාපනතේ සඳහන් වන ආකාරයට ආඥාපනතේ විධිවිධානවලින් නිදහස් නොකරන ලද විහාරස්ථානවල දේපළ පාලනය කිරීම භාරකරුවෙකුට හෝ භාරකරුවන් කීප දෙනෙකුට පැවරිය යුතුය. එසේ කළ විට විහාරස්ථානවල දේපළ භික්ෂූන් විසින් පරිහරණය කළ යුත්තේ භාරකාරයා යැයි කියනු ලබන තැනැත්තාගේ නියමයන්ට අනුව විය හැකිය. ආඥා පනතේ හතරේ දෙවන උපවගන්තිය දක්වන ආකාරයට බලපෑමෙන් නිදහස් කළ විහාරස්ථාන සතු දේපළ පරිපාලනය කළ යුත්තේ පරිපාලන විහාරාධිපතීන් වහන්සේ විසින්ය. (ආනන්ද එන්. තිලකරත්න, 2011, පි. 46) මෙම විධිවිධාන විමසුමට ලක් කිරීමේදී පැහැදිලි වනුයේ දේපළ පරිහරණය සම්බන්ධයෙන් කිසියම් ගැටලු සහගත තත්ත්වයක් පවතින බවය. එහි සඳහන්වන ආකාරයට "විහාරස්ථානයක භික්ෂුවකගේ පෞද්ගලික පරිහරණය සඳහා පූජාකරණ ලද භාණ්ඩ හැර, කිසියම් විහාරයක් සතු හෝ විහාරයට සම්බන්ධ වූ හෝ විහාරය සඳහා වෙන්කළ චංචල නිශ්චල සියලු දේපළ ද, එම විහාරයට ලැබිය යුතු බදු කුලිය, ආදායම් ලාභ සහ මුදල් සහ එම විහාරස්ථානයේ ප්‍රයෝජනය සඳහා පූජා



BHIKSHU UNIVERSITY OF SR
07 APR 2015

කළ සියලු භාණ්ඩ ද ඒ වන විට විහාරයේ භාරකාර තැනට හෝ පරිපාලක විහාරාධිපති භික්ෂුවට පැවරිය යුතු බවය.'' (ආනන්ද එන්. තිලකරත්න, 2011, පිටු. 60 - 61) මෙයින් පැහැදිලි වනුයේ පෞද්ගලික දේපළකට භික්ෂුවකට හිමිකම් කීමට හැකි බවය. ඒ හැර පොදු දේපළකට හිමිකම් කීමේ අයිතියක් භික්ෂුවට නැති බවය. විහාරාධිපති භික්ෂුවකට විහාරය සතු දේපළ භුක්තිවිඳිය හැකි නමුත් විකිණීම්, උකස් කිරීම් වැනි දෑ සිදු කළ නොහැකි බව මෙයින් පැහැදිලි වෙයි.

**සමාලෝචනය**

ක්‍රි. පූ. තෙවන සියවසේ සිට විහාරගම් දේවාල පනත දක්වා වූ ඓතිහාසික මූලාශ්‍ර තුළින් පෙන්නුම් කරන ආකාරයට විහාර සතු දේපළ පරිහරණය සම්බන්ධයෙන් වූ පොදු නිර්ණායකය වනුයේ සංඝික භුක්ති ක්‍රමයයි. විහාරස්ථාන සතු දේපළ කිසිම විටෙකවත් අන්සතු කිරීමට, විකිණීමට, උකස් කිරීම් වැනි දෑ කිරීමට භික්ෂුවට අයිතියක් නැත. නමුත් කැමති ආකාරයකින් බදු දීමට හැකියාවක් තිබේ. ඒ අනුව විහාරස්ථාන සතු දේපළ පරිහරණය සංකීර්ණ ස්වරූපයක් ගෙන ඇති බව මෙයින් පැහැදිලි වෙයි.

**ප්‍රමුඛ පදඃ** ඓතිහාසික මූලාශ්‍ර, විහාර දේපළ, සංඝික භුක්තිය, විහාරාධිපතිකම

**ආශ්‍රිත ග්‍රන්ථ**

Inscriptions of Ceylon, Vol. 1, (1970). (ed.) S. Paranavitana. Ceylon: The Department of Archaeology.

Inscriptions of Ceylon, Vol. II, (Part I) (Dūvegala inscription). (1983)(ed.) S. Paranavitana, Sri Lanka: Published by The Department of Archaeology.

*Epigarphia Zeylanica,* Vol. III, (මොලාහිටියවෙලේගල ලිපිය) (1933) (ed.) H.W. Codrington, New Delhi: Asian Educational Services.

ගුණවර්ධන, :1993). *සිවුර සහ නඟුල,* කොළඹඃ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

*Epigraphia Zeylanica*, Vol. 1, (1904 – 1912) (ed.) D.M.D. Zilva Wickremasinghe, London: The Government of Ceylon by Henry Frowde Oxford University Press.

ආනන්ද, එන්. තිලකරත්න. (2011). *විහාර දේවාලගම් නීතිය.* මුල්ලේරියාවඃ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

UNIVERSITY OF